**<u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>**

**<u>ඇල්පිටිය ප්‍රාදේශීය සභාව</u>**

**ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය: 2026.07.22 දින ප.ව.2.00**

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ විෂය සඳහා 2026.07.22 දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.එදින එම වේලාවට එම කාර්යාලයේදී ලංසුකරුවන් ඉදිරියේදී ලංසුපත් විවෘත කරනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචිය | ලංසු සුරක්ෂණය (රු.) | ලංසු පත්‍ර ගාස්තුව (රු.) | පළපුරුද්ද |
|---|---|---|---|---|
| 01.ඇල්පිටිය ප්‍රාදේශීය සභා අවමංගල්‍යය උත්සව ශාලාව ඉදි කිරීම 11 අදියර SP/G/EPS/2026/02 | C7 ,C6, හා C5 (ගොඩනැගිලි) | 150,000.00 | 4,000.00 | පසුගිය වසර 10 තුළ ගොඩනැගිලි සම්බන්ධ කොන්ත්‍රාත් 02 ක් ඉදිකිරීමේ පළපුරුද්ද හෝ 70%ක් වැඩ අවසන් කිරීම |
| 02. ඇල්පිටිය ප්‍රාදේශීය සභා සුපිරි වෙළඳ සංකීර්ණය නවීකරණය කිරීම SP/G/EPS/2026/06 | C8 ,C7, හා C6 (ගොඩනැගිලි ) | 60,000.00 | 3,000.00 | එම |
| 03.ඇල්පිටිය පොදු වෙළඳපොළ භූමියේ රථවාහන නැවතුම්ස්ථානයක් සකස් කිරීම SP/G/EPS/2026/04 | C9 ,C8, හා C7 (මාර්ග) | 50,000.00 | 3,000.00 | එම |
| ලංසු ඉදිරිපත් කිරීමට පෙර ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලෙසට ලංසුකරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ. | | | | |

01.පළමුවන කොන්ත්‍රාත්තුව සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි සඳහා ලියාපදිංචි ( C7 හෝ ඉහළ) කොන්ත්‍රාත්කරුවන්ට මෙම කොන්ත්‍රාත්තුව පවරනු ඇත.

02. දෙවන කොන්ත්‍රාත්තුව සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි සඳහා ලියාපදිංචි ( C8 හෝ ඉහළ) කොන්ත්‍රාත්කරුවන්ට මෙම කොන්ත්‍රාත්තුව පවරනු ඇත.

03. තෙවන කොන්ත්‍රාත්තුව සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි සඳහා ලියාපදිංචි (C9 හෝ ඉහළ) කොන්ත්‍රාත්කරුවන්ට මෙම කොන්ත්‍රාත්තුව පවරනු ඇත.

04. ලංසුපත් 2026.07.21 වන දින ප.ව. 2.00 දක්වා ඇල්පිටිය සභා ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

05. ප්‍රසම්පාදනය සම්බන්ධ වැඩි විස්තර සතියේ වැඩ කරන දිනවල සාමාන්‍ය කාර්යාල වේලාවෙන් තිදී ඇල්පිටිය සභා ප්‍රධාන කාර්යාලය වෙතින් ලබා ගත හැකිය.

06. ලංසුපත් ඉදිරිපත් කිරීමේදී සෑම ලංසුවක් සමගම ඉහත වගුවේ සඳහන් ආකාරයට බැංකු ඇපකරයක් හෝ මුදල් තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය.බැංකු ඇපකරයක් නම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවක් මගින් ලබා ගෙන තිබිය යුතු අතර, එය කොන්දේසි විරහිත සහ ඉල්ලීම කල විගස ප්‍රතිපූර්ණය කළ හැකි විය යුතුය.මෙම ඇපකරය ලංසුපතේ 09 වන කොටසේ සඳහන් ආකෘති පත්‍රය පරිදි "<u>සභාපති- ඇල්පිටිය ප්‍රාදේශීය සභාව</u>" ලෙස සඳහන් විය යුතුය. මුදල් තැන්පතුවක් නම් අදාල මුදල ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර ගන්නා ලදුපතේ මුල් පිටපත ලංසුපතේ මුල් පිටපත සමඟ ඉදිරිපත් කල යුතුය.

CamScanner

07.ඉදිරිපත් කරන ලද ලංසුපතේ බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය.ලංසුපත් පිටපත් දෙකකින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර එහි මුල් පිටපත සහ අනු පිටපත ලෙස සඳහන් කළ යුතු අතර අවසානයේ එක් කවරයක බහා පහත සඳහන් ලිපිනයට 2025.07.22 වන දින ප.ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් බාරදීම කළ යුතුය. ලංසුපත් විවෘත කරන අවස්ථාවේ දී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයකුට හෝ සහභාගී විය හැකිය.

08. පළමුවන කොන්ත්‍රාත්තුව සඳහා ලංසුවල වලංගු කාලය දින 77 කි.

09. දෙවන කොන්ත්‍රාත්තුව සඳහා ලංසුවල වලංගු කාලය දින 49 කි.

10. තෙවන කොන්ත්‍රාත්තුව සඳහා ලංසුවල වලංගු කාලය දින 49 කි.

11.පූර්ව ලංසු රැස්වීම 2026.07.16 දින පෙ.ව. 10.00ට ඇල්පිටිය සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ.

12. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

2026.07.09

ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව
නගර සභා මාවත, ඇල්පිටිය

| | |
|---|---|
| දුරකථනය | 0912291275/0912291516 |
| Email | elpitiyapradeshiyasaba@gmail.com |
| Web site | www.elpitiyaps.lk |

CamScanner